# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

**අංක 11,845 — 1959 සැප්තැම්බර් 2 වැනි බදාදා — 2.9.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

**අංක 4/59 දරණ ආහාර මිළ නියෝගය** — **සළාක සහල් (තොග සහ සිල්ලර වශයෙන්)**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් ජෝන් වින්සන්ට් ඥන ප්‍රගාසම් වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තියත් සමඟ කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව—

(i) අංක 11,801 සහ 1959 ජුලි 7 දින සහ අංක 11,807 සහ 1959 ජුලි 13 දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රවල පල කරන ලද අංක 2/59 සහ 1959 ජුලි 4 දින දරණ මිළ නියෝගය වහාම මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(ii) මීට යාකර ඇති පළමුවෙනි උපලේඛනයේ 2 වෙනි 3 වෙනි තීරවල සඳහන් මිළ ගණන් තොග වශයෙන් සහල් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක් එම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් තුළ තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(iii) මීට යාකර ඇති 2 වෙනි උපලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් මිළ ගණන් සිල්ලර වශයෙන් සහල් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුළ සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(iv) තවද, මේ නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) සහල් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ සහල් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ආ) සහල් ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(v) සහල් විකිණීමේදී වෙනත් ද්‍රව්‍යයන් හා මිශ්‍රකොට බාල කිරීමෙන් සහල් නොවිකිණිය යුතු බවත් ;

(vi) සහල් විකිණීමේදී සහල් යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිළත් එම ලේඛනවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

(vii) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් යම් ස්ථානයක හෝ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දකු විසින්ම සහල් සඳහා නියම කරනු ලැබූ වැඩිම මිළ සඳහන් දැන්වීමක් එම ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බවත් ;

(viii) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා ''රාත්තල්'' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව නියම කරමි.

(ix) මේ මිළ නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම හා සහල් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුනු දිනය ;

(ආ) විකුනු සහල් ප්‍රමාණය ;

(ඇ) විකුනු සහල් සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළදී ගන්නාට දිය යුතු බවත්, මෙයින් නියම කරමි.

1959 අගෝස්තු මස 27 දින ප.ව. 4ට පුත්තලමේදී අත්සන් තබන ලදී.

ජෝන් වින්සන්ට් ඥනප්‍රගාසම්,
පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන.


2383——ජේ. ඇන්. ආර් 3806—4,000 (9/59)

## 1 වැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>අඩු මිළ සහල් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>වැඩි මිළ සහල් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| ලුනුවිල ... ... ... ... ... | 13 54½ | 24 74½ |
| නාත්තන්ඩිය, මාදම්පෙ, හලාවත සහ ආරච්චිකට්ටුව ... ... | 13 72½ | 24 92½ |
| මහවැව සහ බත්තුළුඔය ... ... ... ... | 13 79½ | 24 99½ |
| දකුණු පිටිගල් කෝරළේ සහ උතුරුපිටිගල් කෝරළේ ප්‍රාදේශික ආදායම් නිලධාරි තැනගේ අනිකුත් සියළුම ප්‍රදේශ ... ... ... | 13 61½ | 24 81½ |
| පුත්තලම ... ... ... ... ... | 13 88½ | 25 8½ |
| ඒත්තාලේ ... ... ... ... ... | 14 14½ | 25 34½ |
| මදුරන්කුලිය ... ... ... ... | 13 96½ | 25 16½ |
| කල්පිටිය ... ... ... ... ... | 14 16½ | 25 36½ |
| ආණමඩුව ... ... ... ... ... | 14 17½ | 25 37½ |

## 2 වැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>අඩු මිළ සහල් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>ශත | 3 වැනි තීරය<br>වැඩි මිළ සහල් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>ශත |
|---|---|---|
| උතුරුපිටිගල් කෝරළේ ප්‍රදේශයට අයිති පුලියන්කඩවර, පුලියන්කාර, කොක්කාවිල, ඇලපහල සහ පුන්ච්චිලත්තාව ... ... ... | 13½ | 23½ |
| උතුරුපිටිගල් කෝරළේ සහ දකුණු පිටිගල් කෝරළේ ප්‍රදේශයේ අනිකුත් සියළුම ප්‍රදේශ ... ... ... ... ... | 13¼ | 23¼ |
| පුත්තලම ... ... ... ... ... | 13¼ | 23¼ |
| ඩච්බේ, එලවන්කුලම සහ නවගත්තේගම ... ... ... | 13¾ | 23¾ |
| පුත්තලම, කල්පිටිය සහ ආණමඩුව ප්‍රාදේශික ආදායම් නිලධාරින්ගේ අනිකුත් සියළුම ප්‍රදේශ ... ... ... ... ... | 13½ | 23½ |

සැළකිය යුතුයි.—(1) මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහලින් එම ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

(2) ශුද්ධ බර හොණ්ඩරයකුට අඩු හෝ වැඩි තොග වශයෙන් විකුණනු ලබන යම් සහල් ප්‍රමාණයක් ඇතහොත් එයට ගෙවිය යුතු වැඩිම මිළ ශුද්ධ බර හොණ්ඩරයකට ගෙවන ඉහත සඳහන් මිළ අනුව ගණන් බලා මිළ තීරණයක් ගත යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.